# තරුණ භික්ෂුව භාවනාවට දක්වන ළැදියාව පිළිබඳ පර්යේෂණාත්මක අධ්‍යයනයක්

දාපනේ චන්දරතන හිමි[1], රිදීගම වනරතන හිමි[2], වැලිපිටියේ පඤ්ඤාරතන හිමි[3], වැලිපිටියේ ඉන්දානන්ද හිමි[4]

## හැඳින්වීම

ලාංකීක භික්ෂු සමාජය අතීතයේ සිටම තම අධ්‍යාත්මික සංවර්ධනය සිදුකර ගන්නා අතරම සාමාජීය, දේශපාලනික හා ආගමික සන්දර්භයන්හි ද කැපීපෙනෙන කාර්යභාරයක් සිදු කරන ලදි. එහෙත් වර්තමානය වන විට දේශපාලනික, සාමාජීය, අධ්‍යාපනික, හා ආගමික ක්ෂේත්‍රයන්හි භික්ෂු ක්‍රියාකාරිත්වයෙහි වඩා වැඩි සක්‍රීය දායකත්වයක් පෙනෙන්නට තිබේ. එහෙත් භික්ෂු ජීවිතයේ මූලිකම අරමුණ වූ අධ්‍යාත්මික සංවර්ධනය ඊට සාපේක්ෂව සංවර්ධනය වී ඇද්ද යන්න විමසා බැලිය යුතු කරුණකි. වර්තමානය වන විට බොහෝ භික්ෂූන් බුදු දහමේ ආගමිකභාවය වඩාත් ඉස්මතු වන ආකාරයෙන් ක්‍රියා කරන ආකාරයක් දක්නට ලැබේ. ඒ තුළින් ගම්‍ය වන්නේ බුදු දහමේ දාර්ශනික හරයන් භික්ෂුව තුළින් ගිලිහී යමින් තිබේද? යන ගැටලුවය.

## අරමුණු

වර්තමාන තරුණ භික්ෂුව භාවනා කිරීම තුළින් කොතරම් දුරට දුරස් වී ඇද්ද? එසේ දුරස්වීමට හේතු මොනවාද? යන්න සොයා බැලීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ. එසේම දුරස් වීමට හේතු විමසා බලා විසඳුම් හා නව යෝජනා ඉදිරිපත් කිරීම ද මෙම පර්යේෂණයේ අරමුණු අතර වේ.

## පර්යේෂණ ගැටලු

- වර්තමාන තරුණ භික්ෂුව භාවනා කිරීම තුළින් කෙතරම් දුරට දුරස් වී ඇද්ද?
- එසේ තරුණ භික්ෂුව භාවනා කිරීම තුළින් දුරස් වීමට බලපා ඇති හේතු මොනවාද?

---

[1] ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, dapanechandima@gmail.com
[2] තාවකාලික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
[3] උපදේශක - ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
[4] ආධුනික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය

අධ්‍යයන ක්‍රමවේදය

ගුණාත්මක පර්යේෂණ එළඹුමක් යටතේ සිද්ධි අධ්‍යයනයක් ලෙස මෙම පර්යේෂණය සිදු කරන අතර, පර්යේෂණයෙහි අරමුණු සාදනයෙහි ලා උපයෝගී කරගන්නා ලද පර්යේෂණ ක්‍රමවේදය වූයේ විස්තරාත්මක සමීක්ෂණ (Explanatory Survey) ක්‍රමයයි. මේ සඳහා ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලයෙන් සියලු වසරවල් ආවරණය වන පරිදි ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා 50 නමක් මෙහි නියැදිය වශයෙන් යොදා ගන්නා ලදි. මෙම අධ්‍යයනය සඳහා තරුණ භික්ෂූන් වහන්සේලා 50 නමක් පමණ යොදා ගත් අතර, උන්වහන්සේලා සියලුම දෙනා විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් වේ. වයස 18-25 වන අතර, අදාළ විශ්වවිද්‍යාලයන්හි පළමු, දෙවන, තෙවන, හා සිව්වන වසර වල සිසුන් නියෝජනය වන පරිදි නියදිය ලබාගෙන ඇත.

සාකච්ඡාව

අපගේ ප්‍රශ්නාවලියට අනුව අදාළ ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා පැවිදි වූ භූමිය (විහාරස්ථානයක, පිරිවෙනක, ආරණ්‍යක) පිළිබඳ විමසීමක් කරන ලදි. එහිදී විහාරස්ථානවල පැවිදි වූ සිසුන් 60% ක් ද පිරිවෙන්වල පැවිදි වූ සිසුන් 38% ක්ද වූ අතර, ආරණ්‍ය සේනාසනවල පැවිදි වූ සිසුන් කිසිවෙක් නොවීය.

පිරිවෙන් අධ්‍යාපනය තුළ දී භාවනාව පිළිබඳ විධිමත් අධ්‍යනයක්, පාඨමාලාවක් හෝ පුහුණුවක් ලබා ඇති ද යන්න පිළිබඳ ප්‍රශ්නය සඳහා පිළිතුරු වී තිබුණේ අප අධ්‍යනයට සහභාගි වූ සිසුන්ගෙන් 90% ක්ම එවන් විධිමත් පුහුණුවක් ලබා නොමැති බවයි.ඉන් 5%ක් පමණක් ඒ පිළිබඳ විධිමත් පුහුණුවක් ලබා තිබුණි.

බුදු දහමෙහි එන ඉගැන්වීම් අතරින් වඩ වඩාත් රුචිකත්වයක් දක්වන්නේ කුමන ඉගැන්වීම් වලට ද යන පැනයට 70% ක් පමණ සිසුන් ප්‍රමාණයක් දාර්ශනික ඉගැන්වීම් සඳහා ද, 30% ක් පමණ ප්‍රමාණයක් ආගමික ඉගැන්වීම් සඳහා ද කැමැත්ත ප්‍රකාශ කර තිබූ අතර, ඉන් එකඳු ශිෂ්‍ය නමක් හෝ භාවනා පිළිබඳ ඉගැන්වීම් සඳහා කැමැත්ත ප්‍රකාශ කර නොතිබුණි. ආගමික ජීවිතයේ දී ඔබ වඩාත් ප්‍රියතාවක් දක්වන්නේ කුමන ආගමික කටයුත්තක නියලීමට දැයි යොමු කරන ලද පැනයට ධර්ම දේශනා පැවැත්වීමට 76% ක පිරිසක් ද කවි බණ දේශනා කිරීමට 4% පිරිසක් ද වෙනත් ආගමික කටයුතු සඳහා 16% ක පිරිසක් ද කැමැත්ත ප්‍රකාශ කර තිබූ නමුත් භාවනා පුහුණු කිරීමට කිසිදු ශිෂ්‍යයෙකු කැමැත්ත ප්‍රකාශ කර නොතිබුණි.

භාවනා කිරීමට ඔබ වඩාත් කැමති පරිසරය පිළිබඳ ප්‍රතිශතය වූයේ ආරණ්‍යගතව 54% ක්ද, බෝධීන් වහන්සේ අභියස 44% ක්ද පන්සල තුළ 1% ක්ද ප්‍රතිචාර දක්වා තිබූ අතර, පංති කාමරය තුළ භාවනා කිරීමට කිසිදු ශිෂ්‍යයෙක් කැමැත්ත ප්‍රකාශ කර නොමැත.

තරුණ භික්ෂුවක් ලෙස ඔබ අධ්‍යයන කටයුතු කරන විශ්වවිද්‍යාලය තුළ භාවනාව ප්‍රායෝගික ප්‍රගුණ කිරීමට කැමැත්තක් දක්වන්නේ යනුවෙන් අප යොමු කර තිබූ පැනයට සිසුන් පනස් දෙනාගෙන්ම 82% ක් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශ කර නොතිබූ අතර, 18% ක් සිසුන් ප්‍රමාණයක් ඒ සඳහා කැමැත්ත ප්‍රකාශකර තිබුණි.

එසේම ඔබ ඉගෙනුම ලබන විශ්වවිද්‍යාලයට භාවනාව අවශ්‍ය වේ යන පැනයට,

එකඟ වෙමි යන්නට 12% ක්ද

තරමක් එකඟ වෙමි යන්නට 30% ක්ද

එකඟ නොවෙමි යන්නට 34% ක්ද

කිසිසෙත් එකඟ නොවෙමි යන්නට 24% ක්ද ප්‍රතිචාර දක්වා තිබුණි.

විශ්වවිද්‍යාල භික්ෂුව පිරිවෙන් අධ්‍යාපනයෙන් පැවත එන භාවනාව වැනි වතාවත් සිදුකළ යුතුය යන පැනයට,

එකඟ වෙමි යනුවෙන් 10% ක්ද

තරමක් එකඟ වෙමි යනුවෙන් 20% ක්ද

එකඟ නොවෙමි යනුවෙන් 30% ක්ද

කිසිසෙත් එකඟ නොවෙමි යනුවෙන් 40% ක්ද ප්‍රතිචාර දක්වා තිබුණි.

ඔබගේ පෞද්ගලික ජීවිතයේ ගැටලු නිරාකරණය සඳහා භාවනාව උපයෝගී වේ. යනුවෙන් අප ඉදිරිපත් කරතිබූ අදහසට,

එකඟ වෙමි යනුවෙන් 68% ක්ද

තරමක් එකඟ වෙමි යනුවෙන් 26% ක්ද

එකඟ නොවෙමි යනුවෙන් 0% ක්ද

කිසිසෙත් එකඟ නොවෙමි යනුවෙන් 6% ක්ද ප්‍රතිචාර දක්වා තිබුණි.

ඔබ විශ්වවිද්‍යාල පරිසරය තුළ භාවනා කිරීමට අකමැත්තක් නොදක්වන්නේ නම් ඊට හේතු සාධක පිළිබඳ අදහස්විමසා තිබූ අතර, සමස්ත ශිෂ්‍ය ප්‍රමාණයෙන් 80% ක් පමණ අදහස් ප්‍රකාශකර තිබුණේ පවතින සමාසික ක්‍රමය තුළ පවතින අවිවේකි බව හා කාර්ය බහුලත්වය ඊට හේතු බවයි. ඉතිරි 20% ගේ අදහස වී තිබුණේ ඒ සඳහා සුදුසු පරිසරයක් විශ්වවිද්‍යාලය තුළ නොමැති බවය.

## නිගමන හා යෝජනා

ඉහත පර්යේෂණයෙහි දත්ත විශ්ලේෂණය කිරීම තුළින් පැහැදිලි වන්නේ බහුතරයක් තරුණ භික්ෂූන් වහන්සේලා තුළ භාවනාව පිළිබඳ සුබවාදී ආකල්පයක් නොමැති බවය. ඒ සඳහා හේතුන් ලෙස මෙහිදී අපහට පෙනී යන්නේ පිරිවෙන් අධ්‍යාපනය තුළින් මේ සඳහා අවශ්‍ය නිසි මග පෙන්වීමක් ලැබී නොමැති බවය. අප විසින් යොමු කරන ලද ප්‍රශ්නාවලියට අනුව අපගේ නියදියට ලක් වූ තරුණ

භික්ෂුන් වහන්සේලාගෙන් 90% ක් දෙනාට (50 න් 45 දෙනෙකුට) පිරිවෙන් අධ්‍යාපනය තුළ දී භාවනාව පිළිබඳ විධිමත් අධ්‍යාපනයක් ලබා දී නොමැති බවයි. එහෙත් භාවනාව පිළිබඳ තරුණ භික්ෂුවගේ ආකල්පය ඉතා යහපත් මට්ටමක පවතින බව පෙනී යයි. "ඔබගේ පෞද්ගලික ජීවිතයේ ගැටලු නිරාකරණය කරගැනීමට භාවනාව උපයෝගී වේ." යනුවෙන් අප යොමු කර තිබූ පැනයට එකඟ වෙමි යන්නට 68% ක පිරිසක් ද තරමක් එකඟ වෙමි යන්නට 26% ක පිරිසක් ද ප්‍රතිචාර දක්වා තිබුණි. ඉන් ගම්‍ය වන්නේ බහුතරයක් තරුණ භික්ෂූන් වහන්සේලා භාවනාව පිළිබඳ සුබදායි ආකල්පයක සිටින බවයි.

විශ්වවිද්‍යාල අධ්‍යාපනය තුළ සිදුකරන භාවනාව පිළිබඳ පාඨමාලාවන් සඳහා බලවත් විරෝධාකල්පයක් දක්වන බව ඉහත දත්ත විශ්ලේෂණයේදී පෙනී යන කරුණකි. ඒ සඳහා හේතුවක් ලෙස සඳහන් කළ හැක්කේ තරුණ භික්ෂූන් වහන්සේලාට කුඩා කල සිට මේ පිළිබඳ ආශාවක් උනන්දුවක් ඇතිවන ආකාරයේ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක නොකිරීම වේ. විශ්වවිද්‍යාලය තුළ පවතින කාර්යබහුල අධ්‍යාපන රටාවට ගැලපෙන ආකාරයේ භාවනා වැඩසටහන් නොපැවතීම ද තවත් ගැටලුවකි. ආරණ්‍ය සේනාසනයක භික්ෂුවක් භාවනා කරන ආකාරයට ම පන්ති කාමරය තුළඑය ක්‍රියාත්මක කළ හැකිද යන්න ගැටලුවකි.

සමස්තයක් ලෙස නිගමනය කළ හැක්කේ භාවනාව තුළින් තරුණ භික්ෂුව ඉතා ශීඝ්‍රයෙන් ඈත්වන ස්වරූපයකි. එහෙත් එහි වගකීම එකී තරුණ භික්ෂුවට ම පැවරිය නොහැකිය. එය අපගේ භික්ෂු අධ්‍යාපන ක්‍රමය තුළ පවතින දුර්වලතාවක් වේ.

නිගමන

- සාමණේර අධ්‍යාපනය (මූලික පිරිවෙන්) තුළ මෙම භාවනාව න්‍යායාත්මක හා ප්‍රායෝගික තලයේ සිට ක්‍රියාත්මක කිරීම.
- විශ්වවිද්‍යාලය වැනි පරිසරයකට යෝග්‍ය භාවනා වැඩසටහන් හඳුන්වා දීම.
- සාම්ප්‍රදායිකත්වයෙන් ඔබ්බට (සම්ප්‍රදාය රැක ගනිමින්) ගොස් මේ පිළිබඳ පර්යේෂණ කිරීම.

ප්‍රමුඛ පද : තරුණ භික්ෂුව, භාවනාව, භික්ෂු අධ්‍යාපන

ආශ්‍රිත ග්‍රන්ථ

Gnanarama, Pategama. (2005). *An Approach to Buddhist Social Philosophy, Second edition* published in Singapore.

Nyanananda,Bhikkhu. (1976). Concept *and reality in Early Buddhist Thought*, Kandy:Buddhist Publication Society.

*භාවනා*.(2012). වෙසක් කලාපය, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව.